**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2017**

-------------------------------------------------------------------------

පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 ජනවාරි 03 දිනැති අංක 1843/45 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ, 2013 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 21 වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය, 108 සහ 111 වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර, විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2018 මැයි 09 වන දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය බැංකුවක ආරම්භ කර තිබූ ස්ථාවර තැන්පතු දෙකකට අදාළව සමාලෝචිත වර්ෂයේ දින 30 කට අදාලව ලැබිය යුතු පොලි ආදායම රු.67,060 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ආයතනය ස්ථාපිත කර වසර දෙකකට අධික කාලයක් ගතවී ඇතත්, ආයතනය දැනටමත් පාවිච්චි කරනු ලබන පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් ස්ථාවර වත්කම් අයිතම් 46 ක් නීත්‍යානුකූලව පවරා ගෙන, තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට සේවක පාරිතෝෂික වෙන්කිරීම රු.100,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1999 අප්‍රේල් 09 දිනැති අංක අමප/99/0438/11/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ආයතනය සහ සේවකයා විසින් බැර කරනු ලබන සියයට 25 ක මුදලින් සියයට 10 ක් විශ්‍රාම වැටුප් අරමුදලට බැර කළ යුතු වේ. එහෙත් ඊට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර තිබුණු 1999 ජුනි 10 දිනැති අංක 747 දරන චක්‍රලේඛය මගින් සේව්‍යයා විසින් අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන සියයට 15 දායක මුදලින් 8/15 ක ප්‍රමාණයක් විශ්‍රාම වැටුප් අරමුදලට බැර කිරීමට උපදෙස් ලබා දී තිබුණි. එම නිසා සියයට 02 ක ප්‍රමාණයක් හෙවත් රු.80,647 ක මුදලක් 2017 වර්ෂයේදී විශ්‍රාම වැටුප් අරමුදලට අඩුවෙන් බැර කර තිබුණි. |

| | |
|---|---|
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ II කොටසේ VIII පරිච්ඡේදයේ 6.2 හි (ii) හා (iii) වගන්ති | තම රාජකාරියට අමතරව කරන සේවාවකින් උපයාගන්නා ගාස්තු ප්‍රමාණයෙන් සියයට 10 ක කොටසක් තමන් අයිති උසස් අධ්‍යාපන ආයතනයට ගෙවිය යුතු වුවද, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.24,022,907 ක බාහිර දේශන ගාස්තුවලින් රු.2,402,290 ක් ගෙවන අවස්ථාවේදී අවකරණය කරගෙන විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.22,108,617 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.11,646,388 ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,462,229 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. පුනරාවර්තන ප්‍රදාන රු.14,700,000 කින් හා අභ්‍යන්තර ආදායම් ඉපැයීම රු.14,019,860 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී වර්ෂ 02 හිම මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමෙන් පසු 2016 වර්ෂයේ රු.45,666,589 ක්වූ ආයතනික දායකය 2017 වර්ෂයේදී රු.66,863,593 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව, සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

2016 / 2017 අධ්‍යයන වර්ෂය සඳහා ආයතනය විසින් සිසුන් 803 ක් බඳවා ගෙන තිබූ අතර, 2017 / 2018 අධ්‍යයන වර්ෂය සඳහා බඳවාගත් සිසුන් සංඛ්‍යාව 467 දක්වා අඩු වී තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව ආයතනය විසින් මාසයකට කිලෝමීටර 3000 ක අවම දුරක් ධාවනය කිරීමේ පදනම මත මාසිකව රු.199,410 ක් ගෙවීමට වාහනයක් කුලියට ගැනීම සඳහා 2017 අප්‍රේල් 01 දින ගිවිසුමකට එළඹී තිබුණි. එම මෝටර් රථය මාස 08 ක කාලය තුළ මාසයකදී ධාවනය කර තිබූ අවම දුර කිලෝමීටර 904 ක් හා උපරිම දුර කිලෝමීටර 2092 ක පරාසයක පැවතුණි. එම නිසා එහි සාමාන්‍ය වියදම කිලෝමීටර එකකට රු.201ක ඉහළ අගයක් වී තිබුණි. තවද ධාවනයට යොදා නොගත් 2017 අප්‍රේල් මාසය සඳහා මාසික කුලිය වශයෙන් රු.199,410 ක් ගෙවා තිබුණි.

(ආ) 2015 වර්ෂයට පෙර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයට අයත් අරමුදල් ගිණුමක් මඟින් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලා පවත්වාගෙන යමින් ආදායම් වියදම් ගිණුම්ගත කර තිබුණි. 2015 දෙසැම්බර් 15 දින සිට වෙනම ආයතනයක් ලෙස මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවා ගැනීමෙන් පසු එම අරමුදල් ගිණුමේ පැවති රු.13,231,258 ක ශේෂය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

--------------------------------

ආයතනයට අයත් කාර්ය මණ්ඩලයේ ස්ථිර කාර්මික නිලධාරියෙකු හා කළමනාකරණ සහකාරවරයෙකු පුරප්පාඩු වීමෙන් ආයතනයේ මෙහෙයුම් කටයුතු ප්‍රශස්ත අයුරින් ඉටුකර ගැනීමට බාධාවක්වී තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

-------------------------

**5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

--------------------------------------------------

2017 තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තම විෂයය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

------------------------------------------

**6.1 අභ්‍යන්තර විගණනය**

------------------------

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009 (I) දරන විගණන සහ කළමනාකරණ චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව, සෑම අභ්‍යන්තර විගණන ඒකකයක්ම තම ආයතනය වෙනුවෙන් කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 6.2 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව, අවම වශයෙන් මාස 03 කට එක්වරක් හෝ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත්, මෙම ආයතනය සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි.

## 6.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී විෂයයන් 18 ක සියයට 20 සිට සියයට 164 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | - වත්කම් විධිමත් පරිදි පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම.<br>- ආදායම් විෂයයන් 04 ක් සඳහා 2016 වර්ෂයේ අයවැය ගත තොරතුරු ඉදිරිපත් කිරීම. |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් පවතින නීති, රීතිවලට අනුගත නොවීම. |